# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | |
|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site – www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 283 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 16/02/2024<br>පැය 2100 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### හොරණ රජමහා විහාරස්ථානයේ රයිගම්පුර නවම් මහ පෙරහර - රථවාහන ගමනාගමනය සීමා කිරීම සම්බන්ධව

හොරණ රජමහා විහාරස්ථානයේ රයිගම්පුර නවම් මහ පෙරහර 2024.02.17 වන දින රාත්‍රී 0800 සිට අලි ඇතුන් 40 කින් හා ශාස්ත්‍රීය නැටුම් කණ්ඩායමක් 85 කින් සමන්විතව වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

හොරණ රජමහා විහාරස්ථානයෙන් ආරම්භ වන පෙරහර රත්නපුර පානදුර මාර්ගයේ ගමන් කර හොරණ බෝගහ අසලට පැමිණ දකුණට හරවා හොරණ අඟුරුවාතොට මාර්ගයේ ගමන්කර HNB හන්දියෙන් වමට හරවා ආරියවිලාස මාර්ගයේ NSB හන්දිය දක්වා ගමන් කර වමට හැරී හොරණ රත්නපුර මාර්ගයේ ප්‍රධාන බස් නැවතුම්පල දක්වා දකුණට හරවා උඩවත්ත මාර්ගයෙන් සෝමානන්ද හන්දිය දක්වා ගමන් කර දකුණට හරවා නැවත රජමහා විහාරස්ථානයට පැමිණීමට නියමිතය.

ඒ අනුව හොරණ රජමහා විහාරස්ථානයෙන් අසළ සිට  පානදුර - රත්නපුර ප්‍රධාන මාර්ගයේ කොටසක් වන විද්‍යාරතන හන්දිය සිට හොරණ පොලිස් ස්ථානයට හැරෙන හංදිය දක්වා කොටසේ වාහන ගමනය සීමා කරන බැවින් ඉහත කාලය තුල එම මාර්ගයේ ගමන් කරනු ලබන රථවාහන පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග:-**

- ❖ රත්නපුර දෙස සිට පැමිණ පානදුර දෙසට සහ කොළඹ දෙසට ගමන් කරනු ලබන සියළුම බර වාහන සව්ගස් හන්දියෙන් දකුණට හරවා තල්ගහවිල මාර්ගයේ ධාවනය කර තල්ගහවිල හන්දියෙන් මොරගහහේන හන්දියට ගොස් වමට හරවා හොරගස් හන්දියට පැමිණ ඔලබොඩුව හන්දිය හරහා ගෝනපල හන්දියට පැමිණ ගමන් කල හැක.

- ❖ රත්නපුර දෙසට සිට පැමිණ අඟුරුවාතොට දෙසට ගමන් කරනු ලබන සියළුම සැහැල්ලු වාහන සහ බර වාහන හොරණ පොලිසිය හන්දියෙන් වමට හරවා හොරණ රෝහල හන්දියට පැමිණ අඟුරුවාතොට දෙසට ගමන් කල හැක.

- ❖ රත්නපුර දෙස සිට පැමිණ පානදුර දෙසට හා කොළඹ දෙසට ගමන් කරනු ලබන සියළුම සැහැල්ලු වාහන හොරණ පොලිසිය හන්දියෙන් වමට හරවා හොරණ රෝහල හන්දියට පැමිණ වතුර මල හන්දියෙන් ලබුගම හන්දිය දක්වා ධාවනය කර ලබුගම හන්දියෙන් දකුණට හරවා පොකුණු විට හන්දියට පැමිණ ගමන් කල හැක.

- මොරගහහේන දෙස සිට පානදුර දෙසට ධාවනය කරනු ලබන සියළුම බර වාහන සහ සැහැල්ලු වාහන හොරගස් හන්දියෙන් දකුණට හරවා ඕලබොඩුව හන්දිය හරහා ගෝනපල හන්දියට පැමිණ ගමන් කළ හැක.

- අඟුරුවාතොට දෙස සිට පානදුර දෙසට ගමන් කරන සියළුම බරවාහන සහ සැහැල්ලු වාහන වතුර මල හන්දියෙන් වමට හරවා ලබුගම හන්දිය දක්වා ධාවනය කර ලබුගම හන්දියෙන් දකුණට හරවා පොකුණුවිට හන්දියට පැමිණ රත්නපුර - පානදුර මාර්ගයට පිවිස වමට හරවා ගමන් කල හැක.

- අඟුරුවාතොට දෙස සිට පැමිණ රත්නපුර දෙසට ගමන් කරනු ලබන සියළුම බර වාහන සහ සැහැල්ලු වාහන හොරණ රෝහල හන්දියෙන් හරවා පොලිසිය හන්දියට ගමන් කර රත්නපුර - පානදුර මාර්ගයට පිවිස දකුණට හරවා ගමන් කල හැක.

- පානදුර දෙස සිට රත්නපුර දෙසට සහ අඟුරුවාතොට දෙසට ගමන් කරනු ලබන සියළුම සැහැල්ලු වාහන පොකුණුවිට හන්දියෙන් වැලිකඩ මාර්ගයට හරවා ලබුගම හන්දිය දක්වා ගමන් කර ලබුගම හන්දියෙන් වමට හරවා වතුර මල හන්දිය දක්වා පැමිණ හොරණ රෝහල හන්දියෙන් වමට හරවා හොරණ පොලිසිය හන්දිය දක්වා පැමිණ දකුණට හරවා ගමන් කල හැක.

- පානදුර දෙස සිට පැමිණ රත්නපුර දෙසට සහ අඟුරුවාතොට දෙසට ගමන් කරනු ලබන සියළුම බර වාහන පොකුණුවිට හන්දියෙන් වමට හරවා ගෝනපල හන්දිය දක්වා ගමන් කර ගෝනපල හන්දියෙන් ඕලබොඩුව හරහා හොරගස් හන්දියට පැමිණ හොරගස් හන්දියෙන් වමට හරවා මොරගහහේන හරහා තල්ගහවිල හන්දියට පැමිණ තල්ගහ විල හන්දියෙන් දකුණට හරවා සව්ගස් හන්දියට පැමිණ වමට හරවා ගමන් කල හැක.

**රථ වාහන ගාල් කිරීම :-**

පෙරහර නැරඹීමට පැමිණෙන මහජනතාවට රථවාහන ගාල් කිරීම සඳහා හොරණ මහජන සතිපොල භූමිය, නගර සභා ක්‍රීඩාංගණය, පොකුණු විට ජනසෙත ක්‍රීඩාංගණය, විද්‍යාරතන ක්‍රීඩාංගණය සහ හොරණ රාජකීය ක්‍රීඩාංගණය වෙන් කර ඇත.

මේ සම්බන්ධව මහජනතාව සහ රියදුරන් දැනුවත් කිරීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට අදාළ රථවාහන සැලැස්ම මේ සමග එවමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**